පාඩම:- සකපෝරුව භාවිතයෙන් භාණ්ඩ ඉදි කරයි.

11 ශ්‍රේණියේ පෙළ පොතේ පිටු අංක 94 – 101 දක්වා හොඳින් අධ්‍යයනයෙහි නිරතවීමෙන් පසු පහත සඳහන් අභ්‍යාසවල නිරතවන්න. දී ඇති භාණ්ඩ හොඳින් නිරීක්ෂණය කරන්න.

ඉහත මැටි භාණ්ඩ නිර්මාණය කිරීම සඳහා සකපෝරුව අවශ්‍ය වේ.

1. සකපෝරුවේ ක්‍රියාකාරිත්වය අනුව වර්ග 3කි.ඒවා නම් කරන්න.
2. සකපෝරුව ආධාරයෙන් භාණ්ඩයක් ඉදි කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ නම් කරන්න.
3. නිවැරදි ආකාරයට දෙඅතින් මැටි පදම් කිරීමේ ක්‍රම දෙක නම් කරන්න.
4. මැටි භාණ්ඩ නිර්මාණය කිරීමේදී පදම් කළ මැටි භාවිතයේ ඇති වාසිය කුමක්ද?
5. පහත දැක්වෙන්නේ සකපෝරුවක මැටි භාණ්ඩ ඉදිකිරීමේ පියවර වේ.
   i. මෙය අනුපිළිවෙලට ලියා දක්වන්න.
      - වයනය ලබා ගැනීම.
      - පදම් කරගත් මැටි පිඩ සකපෝරුව මත සවි කිරීම.
      - මැටි පිඩ විවෘත කිරීම.
      - බදුනේ බිත්තිය ඉහලට එසවීම.
      - සකපෝරුවෙන් බදුන ඉවත් කිරීම.
      - මැටි පිඩ මධ්‍යගත කිරීම.
      - බදුනේ පතුළ නිසි පරිදි සැකසීම.
      - බදුනේ කට නිමහම් කිරීම.
      - බදුන නිමහම් කිරීම.
   ii. ඉහතින් ඔබ ලියූ මැටි භාණ්ඩයක් ඉදි කිරීමේ අනුපිළිවෙල රූපසටහන් මගින් දක්වා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.
6. ඉදි කළ මැටි භණ්ඩ නිමහම් කිරීමේදී සැළකිලිමත් විය යුතු කරුණු මොනවාද?